# කළමනාකරණ කමිටු රැස්වීම.

දිනය - 2016.04.05

වේලාව - ප.ව. 02.00

ස්ථානය - ප්‍රධාන ලේකම් කාර්යාලය (බ.ප.)

මූලාසනය - ජේ.එම්.සී.ජයන්ති විජේතුංග මහත්මිය (ප්‍රධාන ලේකම්-බ.ප.)

සහභාගී වූ නිලධාරීන්,

- **කේ.කේ. චම්පිකා කනේරු මිය.**
  **නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පාලන)**
- **සිරිසෝම ලොකුවිතාන මහතා**
  **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)**
- **එන්. බන්දුල ප්‍රේමකුමාර මහතා**
  **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය)**
- **ඩී.එම්.එන්. දිසානායක මිය**
  **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්)**
- **ඩබ්.එම්.ඩී.එන්. රණසිංහ මයා**
  **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)**
- **ජී.ඒ.එන්. ජයන්ත මයා**
  **ආදායම් කොමසාරිස්**
- **චම්පිකා පතිරණ මිය**
  **අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)**
- **නිශාන්ති විජේසුන්දර මිය.**
  **අධ්‍යක්ෂ (ගිණුම් හා ගෙවීම්)**
- **සුනේත්‍රා පතිරත්න මිය.**
  **අධ්‍යක්ෂ (අයවැය)**
- **මහේෂ් විජේසේකර මයා.**
  **අධ්‍යක්ෂ (ගොඩනැගිලි)**
- **එල්.ඒ.බී.එල්.ගුණසේන මිය.**
  **ප්‍රධාන ගණකාධිකාරී (ඉංජිනේරු)**
- **සේනක පී. සිල්වා මයා.**
  **අධ්‍යක්ෂ (සැලසුම්)**
- **කේ.එන්. සූරියආරච්චි මිය.**
  **සහකාර ප්‍රධාන ලේකම් (පාලන)**

# සාකච්ඡා කරන ලද කරුණු

## පාලන අංශය

| අනු අංකය | කාරණය | තීරණය | වගකීම |
|---|---|---|---|
| 01 | කාර්යය සාධන වාර්තාව 2015 | 2015 වාර්තාව පිළියෙළ කිරීමේ කටයුතු දැනටමත් ආරම්භ කර ඇති බවත්, ඒ සඳහා තොරතුරු තවමත් ලැබෙමින් පවතින බවත්, අදාළ ආයතන වෙත සිහි කැඳවීම් ලිපි යොමු කර ඇති බවත්, නි.ප්‍ර.ලේ.(පාලන) විසින් දැනුම් දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන). |

## මූල්‍ය අංශය

| අනු අංකය | කාරණය | තීරණය | වගකීම |
|---|---|---|---|
| 01 | Motor Traffic Agreement | Motor Traffic ගිවිසුම පිළිබඳ නැවත විමසීමක් කිරීම | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය). |
| 02 | ප්‍රසම්පාදන සැලැස්ම අනුමත කර ගැනීම. | ප්‍රධාන ලේකම් කාර්යාලයේ සැලැස්ම සකස් කර අවසන් බව නි.ප්‍ර.ලේ.(මුල්‍ය) විසින් දැනුවත් කරන ලදී.<br><br>දැනටමත් මේ සම්බන්ධව ක්‍රියාමාර්ග ගෙන නොමැති අනෙකුත් අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත ලිපියක් ඉදිරිපත් කිරීම (ඇමතිවරුන් සඳහා පිටපත් ද සහිතව). | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය).<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්). |
| 03 | මුදල් කොමිෂන් සභා චක්‍රලේඛ 2016/01හි වගන්ති 1.3.2 සහ 8හි ඇතුළත් නිර්දේශ ක්‍රියාත්මක කිරීම. | ප්‍රාදේශීය පරිපාලනය සඳහා පළාත් සභා අයවැයෙන් ප්‍රතිපාදන ලබා දීමට කටයුතු කිරීම | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) |

**<u>පිරිස් හා පුහුණු අංශය.</u>**

| අනු අංකය | කාරණය | තීරණය | වගකීම |
|---|---|---|---|
| 01 | පුහුණු වැඩසටහන්, බඳවා ගැනීම් පරිපාටි සහ පුරප්පාඩු. | දැනට ක්‍රියාත්මක කර නොමැති ස්ථාන- මාරු වහාම ක්‍රියාත්මක කිරීම සඳහා එම ස්ථානමාරු, අමාත්‍යාංශ 5ට වර්ගීකරණය කර අදාළ ලේකම්වරුන්ට ලිපියක් ඉදිරිපත් කිරීම (ආණ්ඩුකාර ලේකම් වෙත පිටපත් ද සහිත ව.)<br><br>පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වන සම්පත් දායකයින් පිළිබඳ විස්තර ප්‍රධාන ලේකම් වෙත ලැබීමට සැලැස්වීම | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |

**<u>සැලසුම් අංශය</u>**

| අනු අංකය | කාරණය | තීරණය | වගකීම |
|---|---|---|---|
| 01 | ප්‍රගති සමාලෝචන රැස්වීම. | අධ්‍යක්ෂ අභ්‍යන්තර විගණන විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව පිළිබඳ ව ලේකම්වරුන්ගේ සාකච්ඡාවේ දී තවදුරටත් විමසීමට තීරණය කරන ලදි. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්)<br><br>අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන) |
| 02 | සියලු ම අමාත්‍යාංශ වල ප්‍රගතිය සොයා බැලීම. | සති 2කට වරක් ප්‍රගති සමාලෝචනය සහ මසකට වරක් ප්‍රධාන ලේකම්ගේ ප්‍රධානත්වයෙන් අමාත්‍යාංශ මට්ටමින් රැස්වීමක් කැඳවීමට කටයුතු කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |
| 03 | මන්ත්‍රීවරුන් දැනුවත් කිරීමේ රැස්වීමක් සංවිධානය කිරීම. | PSDG, PDG සඳහා වෙන් කර ඇති මුදල් සම්බන්ධව මන්ත්‍රීවරුන් දැනුවත් කිරීම සඳහා රැස්වීමක් සංවිධානය කල යුතු බවට උපදෙස් දෙන ලදී.<br><br>එසේම, මන්ත්‍රීවරුන් සඳහා ශුන්‍ය පාදක අයවැයකරණය පිළිබඳ ව වැඩසටහනක් සංවිධානය කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |

| | | | |
|---|---|---|---|
| 04 | අධීක්ෂණ ක්‍රමවේදයන් (Monitoring System) පවත්වාගෙන යාම. | අධීක්ෂණ ක්‍රමවේදයන් (Monitoring System) පවත්වාගෙන යාම සඳහා තොරතුරු ලබා ගැනීමට හැකි වන සේ නිලධාරීන් කාර්යාලයේ රැඳී සිටිය යුතු බවට අමාත්‍යාංශ ලේකම්වරුන් ලිඛිතව දැනුවත් කිරීමට කටයුතු කිරීම | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |
| 05 | මහ නගර සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම | මහ නගර සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා ලද මාර්ගෝපදේශන ග්‍රන්ථය අදාළ නිරීක්ෂණ ඉදිරිපත් කිරීම සඳහා සියලු ම ආයතන වෙත යොමු කර ඇති බව නි.ප්‍ර.ලේ.(සැලසුම්) විසින් ප්‍රධාන ලේකම් වෙත දන්වන ලදි. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |
| 06 | වේරගොඩ මයා විසින් යොමු කරන ලද සංවර්ධන කමිටුව හා සම්බන්ධ ලිපිය | ලිපියේ දක්වා ඇති පරිදි කටයුතු කිරීම සහ ඒ සඳහා පිළිතුරු යැවීම සඳහා කටයුතු කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |
| 07 | වසරකට වඩා වැඩි කාලයක් ගත වන ඉදිකිරීම් සඳහා සැලසුම් අංශය තුල ව්‍යාපෘති අනුමත කිරීම සඳහා කමිටුවක් පත් කිරීම | ශක්‍යතා වාර්තාවක් සමඟ ඉදිරිපත් කරන ලෙස දැනුම්දීම හා අවශ්‍යතා පිළිබඳ ව සෑහීමකට පත් විය හැකි ව්‍යාපෘති කැබිනට් මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම සුදුසු ය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |

**ඉංජිනේරු අංශය**

| අනු අංකය | කාරණය | තීරණය | වගකීම |
|---|---|---|---|
| 01 | පළාත් සභාවේ ලේඛන සංරක්ෂණය. | වෙබ් අඩවිවල සහ තොරතුරු වල ආරක්ෂාව පිළිබඳ ව CERT ආයතනය සමඟ සාකච්ඡා කර ඇත. ඒ පිළිබඳ ව වාර්තාවක් ඉදිරිපත් කිරීම හා වෙබ් අඩවි සැකසීම පිළිබඳ ව ICTA ආයතනය සම්බන්ධ කර ගැනීම හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශ ලේකම් වසන්ත දේශප්‍රිය මහතාගේ සහාය ලබා ගැනීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 02 | ඉදිකිරීම් කොන්ත්‍රාත් ලබා ගැනීම. | වසරේ මුල් කාර්තුවේ දී ම ඉදිකිරීම් කොන්ත්‍රාත් ආරම්භ කිරීම හා නියමිත කාල රාමුව පිළිබඳව ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු ඇමතිවරු හා ලේකම්වරු ලිඛිත ව දැනුවත් කිරීමට කටයුතු කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු). |

| | | | |
|---|---|---|---|
| 03 | මොරගන්න පුහුණු මධ්‍යස්ථානය. | පුහුණු මධ්‍යස්ථානයේ යෝජිත ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු සිදු කිරීමේ දී සාම්ප්‍රදායික පෙනුමෙන් බැහැරව ආකර්ෂණීය ස්වරූපයක් ගෙන දෙන ආකාරයේ නවීන ගෘහ නිර්මාණ ශිල්පී ක්‍රම භාවිතා කරමින් සිදු කිරීම.<br><br>පුහුණු මධ්‍යස්ථානයේ යෝජිත ගොඩනැගිල්ල සඳහා ශක්‍යතා අධ්‍යන වාර්තාවක අවශ්‍යතාව සහ එය නිමැවුම සඳහා විශේෂිත පුද්ගලයකු පත් කිරීම.<br><br>වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් අත්තනගලු ඔයෙහි රක්ෂිතය පිළිබඳ ව අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු).<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |
| 04 | පළාත් සභාවේ පවතින තොරතුරු තාක්ෂණ සේවයේ පරිපාලනමය යාන්ත්‍රණයේ අඩුව | තොරතුරු තාක්ෂණය උපයෝගී කර ගෙන කාර්යක්ෂම සේවාවක් සැපයීම සහ පළාත් සභාවේ වෙබ්අඩවි යාවත්කාලීන කිරීම සඳහා පවතින පරිපාලනමය යන්ත්‍රණයක අඩුව පිරිමැසීම වෙනුවෙන් නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) විසින් යෝජනා කරන ලද - ICTA ආයතනයේ උපදේශක වරයෙකුගේ සේවය ලබා ගැනීම සහ තොරතුරු තාක්ෂණ ආයතනය සෘජුව ප්‍රධාන ලේකම් යටතේ ආයතනයක් ලෙස පවත්වා ගෙන යාම සඳහා ආණ්ඩුකාරතුමා වෙත ඉල්ලීමක් කිරීම | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 05 | ගරු පළාත් සභා මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ ඉදිකිරීම සඳහා මුදල් වෙන් කරනු ලබන ව්‍යාපෘතිවල ප්‍රසම්පාදන ක්‍රමය ඇතුළත් නො වීම | මේ සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් විධිවිධාන අනුගමනය කළ යුතු බව ප්‍රධාන ලේකම් විසින් අවධාරණය කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |
| 06 | ඉංජිනේරු කාර්යාංශයේ වාහන සඳහා වෙන් කර ඇති ඉන්ධන ප්‍රතිපාදන තුලින් ඉතිරි කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රායෝගික අපහසුතාව | චක්‍රලේඛ ප්‍රකාර ව ඉන්ධන 10%ක් ඉතිරි කිරීමේ ක්‍රියාමාර්ගයක් සඳහා යොමු වීමේ අවශ්‍යතාව ප්‍රධාන ලේකම් විසින් පෙන්වා දෙන ලදි. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |

| | | | |
|---|---|---|---|
| 07 | මධ්‍යම රජයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ කොටස් වශයෙන් විශාල පරිමාණයේ මුදල් වෙන් කිරීමේ දී එවැනි ව්‍යාපෘති සඳහා දිගින් දිගටම මුදල් වෙන් කිරීමේ තහවුරු ව පිළිබඳ වගකීම | ව්‍යාපෘතිය සඳහා වැය වන මුළු මුදල වෙන් කිරීමක් සිදු නොකොට, අදියර වශයෙන් දැක්වීමේ දී ව්‍යාපෘති ඇරඹීම ගැටලු සහගත බව දන්වා මන්ත්‍රීවරුන් වෙත ලිපියක් ඉදිරිපත් කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |
| 08 | ඉංජිනේරු කාර්යාංශයේ ප්‍රාදේශීය කාර්යාල 13 සඳහා සංවර්ධන නිලධාරීන් 13කගේ සේවය ලබා ගැනීම. | සැලසුම් අංශය යටතේ සිටින නිලධාරීන්ගෙන් සංවර්ධන නිලධාරීන් 13 දෙනෙකු ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල සඳහා අනුයුක්ත කිරීමට අවශ්‍ය කටයුතු කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 09 | මුරකරුවන් යටපත් කර, වෙස්ප්‍රෝ ආරක්ෂක සේවයට රාජකාරී ලබා දීම | අනුමත කාර්ය මණ්ඩලයේ සේවකයින් බැවින් මුරකරුවන් යටපත් කිරීම සුදුසු නොවන බව ප්‍රධාන ලේකම් විසින් පෙන්වා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 10 | දිස්ත්‍රික්ක 3හි ඉංජිනේරු කාර්යාංශ සඳහා ප්‍රධාන ඉංජිනේරු තනතුරු 3ක් ස්ථාපනය කිරීම | මේ සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත ලිපියක් ඉදිරිපත් කර ඇති බවත්, තවමත් පිළිතුරක් ලැබී නොමැති බව ප්‍රධාන ලේකම් විසින් දැනුවත් කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |

<u>**වෙනත්**</u>

| අනු අංකය | කාරණය | තීරණය | වගකීම |
|---|---|---|---|
| | රාමඤ්ඤ නිකායේ උපසම්පදා උත්සවය | ප්‍රාදේශීය ඉංජිනේරු ඇස්තමේන්තු සඳහා රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාව (STC) වෙත අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ගෙවීම් සිදු කරන ලෙස අමාත්‍යාංශ ලේකම් දැනුවත් කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු). |